පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ චක්‍ර ලේඛ අංක: 01/2015

මගේ අංක : පීඑල් /15/03/චක්‍රලේඛ
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
330, යූනියන් පෙදෙස
කොළඹ

2015.12.23

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත

**<u>ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය නිසා සිදුවී ඇති සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සාමාජීය බලපෑම අවම කර ගැනීම සඳහා යෝජිත වැඩසටහන ක්‍රියාවට නැංවීම</u>**

අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි ප්ලාස්ටික් /පොලිතින් භාවිතය නිසා සිදුවන සාමාජීය, සෞඛ්‍ය හා පාරිසරික බලපෑම අවම කිරීම සඳහා පිළියල කරන ලද වැඩ සටහන 2016 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක කළ යුතු වේ.

එබැවින් එම වැඩ සටහනෙහි හඳුනාගෙන ඇති එක් ක්‍රියාමාර්ගයක් ලෙස 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කර ඇති අංක 1466/5 – 2006.10.10 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ 23 ද වගන්තිය යටතේ වූ නියමයට අනුව මයික්‍රෝන 20 ට අඩු සාප්පු මලු හා ආහාර දැවටුම් නිෂ්පාදනය හා විකිණීම වැලැක්වෙන අතර රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වල ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කළයුතු වේ.

1. සියලු පළාත් සභා බල ප්‍රදේශයන් යටතට ගැනෙන පළාත් පාලන ආයතන ඇතුලු සියලු රාජ්‍ය ආයතන දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20 ට අඩු පොලිතින් බෑග් හා ආහාර දැවටුම් රැගෙන ඒම තහනම් කිරීම (2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි) සහ එම ආයතන තුල ඉහත නිෂ්පාදන විකිණීම තහනම් කිරීම.

2. ආයතන පරිශ්‍රය තුලට මයික්‍රෝන 20 ට වැඩි පොලිතින් බෑග්, අනෙකුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම හැකිතරම් දුරට පාලනය කිරීම සහ එවැනි ද්‍රව්‍ය විකිණීම පාලනය කිරීම.

3. සියලු පළාත් සභා බල ප්‍රදේශයන් යටතට ගැනෙන රාජ්‍ය ආයතනයන් තුලට ආහාර රැගෙන ඒමේදී ප්ලාස්ටික්, පොලිතින් බෑග් සහ පොලිතින් ආහාර දැවටුම් වෙනුවට විකල්ප ඇසුරුම් ක්‍රමවේද හෝ නැවත භාවිතා කළ හැකි හෝ දිරායන ඇසුරුම් ක්‍රමවේදයන් භාවිතා කිරීම කෙරෙහි කාර්ය මණ්ඩල දිරිගැන්වීම හා උනන්දු කරවීම.

4. ප්ලාස්ටික් හා පොලිතින් මලු විවෘත දහනය මගින් දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs) ඩයොක්සීන් සහ පියුරාන් වැනි මිනිස් සෞඛ්‍යයට ඉතාමත් අහිතකර වායූන් පිටවන නිසා, එම ද්‍රව්‍ය ආයතන පරිශ්‍රයන් තුල විවෘත දහනයෙන් තොරව ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවලට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5. ඉහත කරුණු සම්බන්ධයෙන් සියලු පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අනුබද්ධිත ආයතනවල කාර්ය මණ්ඩලයන් දැනුවත් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිම.

6. සියලු පළාත් සභා බල ප්‍රදේශයන් යටතට ගැනෙන පළාත් පාලන ආයතන ඇතුලු සියලු රාජ්‍ය ආයතන විසින් ආයතනික වශයෙන් පරිභාහිරව සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් වලදී ඉහත 01 සිට 04 දක්වා කරුණු අනුගත කිරිමට අවශ්‍ය උපදෙස් ඔවුන් වෙත ලබාදිම.

7. පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන් තුල සංවිධානය කරනු ලබන දේශපාලන හා ආගමික රැස්වීම් හා අනෙකුත් විවිධ උත්සව කටයුතු සඳහා සැරසිලි භාවිතයට විවිධ පුද්ගලයින් හා ආයතන වලින් කරනු ලබන ඉල්ලීම්වල දී ප්ලාස්ටික් හා පොලිතින් භාවිතයෙන් බැහැරව ඒ සඳහා විකල්ප සැරසිලි ක්‍රම භාවිතා කිරීමට පමණක් අනුමැතිය ලබාදෙන ලෙස පළාත් පාලන ආයතන වෙතින් අවශ්‍ය උපදෙස් ලබාදීම.

කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්නේ නම් මැනවි.

එච්.ටී.කමල් පත්මසිරි
ලේකම්
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
2. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
3. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් පාලන) හා
4. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( පළාත් සභා) අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා